සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2019
# නාට්‍ය හා රංගකලාව - I

**11 ශ්‍රේණිය**

නම/ විභාග අංකය: කාලය පැය 01 යි.

- පහත දැක්වෙන පද්‍ය හා සංවාද ඛණ්ඩ ආශ්‍රයෙන් අංක 01 සිට 05 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A - ඇත්තටම බොලං මූ වැද්දා ද

B - කරකවනවා වැඩියි යාපනෙ භූමිකම්පාව වගෙ

C - වගුරට නරනිඳු දඹදිව පරසිඳු
හට දා වූ මම වෙමි දෙවුදු

D - මගෙ මන්දිර නම් බිසෝගේ
යාඥාව බෝය වෙගෙ
නෙක චණ්ඩ ව්‍යාඝ්‍ර ආදී
හිමාල දේස වාසි

E - ආයුබෝවන් ! සබෙ මහතුන්ටා
බොහොම කාලෙකින් ආවෙ දැනගන්ටා

01 එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යධර්මී නාට්‍යයකට අයත් වන්නේ,
(1) A (2) B (3) C (4) D

02 නූර්ති නාට්‍ය සඳහා අයත් වන්නේ,
(1) A (2) D (3) E (4) B

03 සන්නියකුම ශාන්තිකර්මයට අයත් වන්නේ,
(1) A (2) B (3) C (4) E

04 නාඩගම්වල ස්ථාවර පාත්‍ර චරිතයක් හා සම්බන්ධ වන්නේ,
(1) B (2) C (3) D (4) E

05 උඩරට ශාන්තිකර්මයක නාට්‍යමය අවස්ථාවක් සඳහා අදාළ වන්නේ,
(1) A (2) D (3) C (4) B

- නිවැරදි පිළිතුර තෝරන්න.

06 ආංගික හා සාත්වික අභිනය මූලිකව වාචික අභිනය භාවිතා නොවී කිසියම් සිද්ධියක් නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම
(1) අනුරූපණය නම් වේ. (2) අභිරූපණය නම් වේ.
(3) අවස්ථා නිරූපණය නම් වේ. (4) අනුකරණය නම් වේ.

07 නෘත්‍ය යනුවෙන් අදහස් කරනු ලබන්නේ,
(1) සාත්වික අභිනය සහිත නැටුමකි. (2) ශුද්ධ නැටුමකි.
(3) ආංගික අභිනය පමණක් දැක්වීමකි. (4) සතර අභිනයෙන් පෝෂණය වූවකි.

08 ප්‍රධාන අංගරචනා ප්‍රභේදවලට අයත් විය යුත්තේ,
(1) ඍජු අංගරචනය, සරල අංගරචනයයි.
(2) සරල අංගරචනය, චරිතාංග අංගරචනයයි.
(3) ඍජු අංගරචනය, නිර්මිත චරිත අංගරචනයයි.
(4) ඍජු අංගරචනය, විකාරරූපී අංගරචනයයි.

09 නාට්‍ය සංගීතය සඳහා නිවැරදි ප්‍රකාශය විය යුත්තේ,
(1) සංගීතය මගින් රස ජනනයට බාධා පැමිණේ
(2) නාට්‍යයේ ඉදිරි පැවැත්මට සංගීතය වැදගත් වේ.
(3) නාට්‍යයේ අවස්ථා තීව්‍ර කිරීම සඳහා සංගීතය යොදාගනී.
(4) තේමාවට උචිත ව සංගීතය යොදාගත යුතුය.

10 ක්ෂණික නිරූපණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) නිර්මාණශීලීව පුහුණුවී අවස්ථා නිරූපණය කිරීම.
(2) යම්කිසි අදහසක් ප්‍රේක්ෂකයා වෙත රඟදැක්වීම.
(3) පෙර පුහුණුවකට අනුව සිදුවීමක් ඉදිරිපත් කිරීම.
(4) පිටපතකින් තොරව දෙන ලද ඉඟියකට අනුව සීමිත කාලයක් තුළ අවස්ථාවක් නිරූපණය කිරීම.

11 රංග ආලෝකකරණයේ පරමාර්ථය විය යුත්තේ,
(1) වේදිකාවේ අඳුර නැති කිරීමයි.
(2) වර්ණ භාවිත කිරීමකි.
(3) ප්‍රේක්ෂක අවධානය දිනාගැනීම.
(4) නාට්‍යයකට විශේෂත්වයක් එක්කිරීමකි.

12 ප්‍රාසාංගික කලාවට අයත් වන්නේ,
(1) මූර්ති, ඔපෙරා, සංගීතය, නර්තනය
(2) බැලේ නාට්‍ය, ගීත නාට්‍ය, සංගීතය, නර්තනය
(3) ඔපෙරා, චිත්‍රපට, බැලේ, ගීත නාට්‍ය
(4) නාට්‍යය, නර්තනය, ඔපෙරා, ටෙලිනාට්‍ය

13 දර්පණ අභ්‍යාස රූපණ ශිල්පියකුට වැදගත් වන්නේ,
(1) සබකෝලය දුරුකිරීම නිසාය.
(2) මතක ශක්තිය වැඩිකරන නිසාය.
(3) ක්ෂණිකව ක්‍රියාකිරීමට හැකියාව ලැබේ.
(4) අභිනයන් ප්‍රබලව භාවිත වන නිසාය.

14 රංගභූමි අලංකරණ සඳහා යෝග්‍ය නොවන්නේ,
(1) සරලව සකස් විය යුතුය.
(2) නාට්‍යෝචිත ව භාවිත කළ හැකි විය යුතුය.
(3) සංකේතාත්මක ව ඉදිරිපත් කළ යුතුය.
(4) හුදු සැරසිල්ලක් ලෙස භාවිතය.

15 අංග රචන ශිල්පියා නාට්‍ය නිර්මාණයට දායක වීමේදී වඩා සහයෝගයෙන් කටයුතු කළ යුතු වන්නේ,
(1) වේශභූෂණ ශිල්පියා, පිටපත් රචක, රංගාලෝක ශිල්පියා
(2) නාට්‍ය නිෂ්පාදක, නාට්‍ය අධ්‍යක්ෂ, පසුතල නිර්මාණ ශිල්පියා
(3) ප්‍රේක්ෂකයා, පිටපත් රචක, රංගාලෝක ශිල්පියා
(4) රංගාලෝක ශිල්පියා, පසුතල නිර්මාණ ශිල්පියා, වේශභූෂණ ශිල්පියා

16 රංග රචනය දී (choreography) වඩා සැලකිල්ලට ගත යුත්තේ,
(1) සමබරතාව, නිර්මාණශීලි බව, අර්ථය මතු කිරීම හා දෘශ්‍යමය ප්‍රබලතාව
(2) නර්තනය, සංගීතය හා නාට්‍යෝපකරණ නිර්මාණශීලීව භාවිතය
(3) අංගරචනය, වේශභූෂණ හා රංගාලෝකයේ ස්වභාවයයි.
(4) සමබරතාවය, පසුතලය, සංගීතය නිර්මාණශීලීව භාවිතය.

17 ගම්මඩු, දෙවොල්මඩු උපත් කතාවට අනුව විශේෂ වන්නේ,
(1) ඔලුවිල්, ගෙම්බා, ගවයා, ගෝනා
(2) සේරමාන් රජු, ගෝනා, මානෙල් විල, මැඩියා
(3) අසුපාල, ගෝනා, මානෙල් විල
(4) මානෙල් විල, මැඩියා, ගෝනා, මංගර කුමරු

18 සොකරි රංග ශෛලියට අදාළ නොවන්නේ,
(1) කමත රංගභූමිය වීම.
(2) සියලු චරිත පිරිමින් විසින් රඟ දක්වයි.
(3) නාට්‍යධර්මී ලක්ෂණවලින් සමන්විත නොවේ.
(4) සරල වෙස් මුහුණු භාවිතය.

19 කෝලම් රංග භූමියේ විශේෂත්වය වන්නේ,
(1) හතරැස්වීම
(2) වෙස් අත්ත භාවිතය
(3) පිදුරු ගොඩගසා තිබීම
(4) වහලක් තිබීම

20 ඇහැලේපොල, සිංහවල්ලි, මාතලන් යන නාඩගම් නිර්මාණය කළ ශිල්පියා වන්නේ,
(1) පිලිප්පු සිංඤෝ (2) පී. පීරිස් (3) ජෝන් ද සිල්වා (4) පේදුරු සිංඤෝ

- **පහත සඳහන් වගුව උපයෝගී කරගෙන අංක 21 සිට 24 දක්වා වූ ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| • ඉමැජිනික් ඉන්වැලිඩ් | • හස්තිකාන්ති මන්තරේ | • දෙවෙනි මහින්ද | • හුණුවටය |
| • මාකො මිලියන්ස් | • මහාසාර | • නාග ගුරුල්ලා | • මකරා |
| • ආම්ස් ඇන්ඩ් ද මෑන් | • හව කඩතුරාව | • දෝන කතිරිනා | • හෙලෙ නගිං |
| • වෙයා විමෙන් රූල් | • ජේමතෝ ජායති ශෝකෝ | | • ඩෝං පූතා |

21 විශ්ව විද්‍යාල කථිකාචාර්ය ඊ. එෆ්. සී. ලූඩොවෙයික්ගේ නාට්‍ය නිෂ්පාදනය වන්නේ,

(1) B (2) A (3) C (4) D

22 මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණය වන්නේ,

(1) A (2) C (3) D (4) B

23 කේ. බී. හේරත් නාට්‍යකරුගේ නිර්මාණය වන්නේ,

(1) A (2) B (3) D (4) C

24 අනුවර්තන නාට්‍ය පමණක් ඇතුළත් වන්නේ,

(1) A (2) D (3) B (4) C

25 ටීටර් නාට්‍යය සඳහාත්, මිනර්වා නාට්‍යය සඳහාත් පුරෝගාමී නාට්‍යකරුවන් පිළිවෙලින් දැක්වෙන්නේ,

(1) සිරිසේන විමලවීර, බී. ඒ. ඩබ්. ජයමාන්න (2) ජෝන් ද සිල්වා, ආර්. ආර්. සමරකෝන්

(3) හෙන්රි ජයසේන, එඩී ජයමාන්න (4) කේ. බී. හේරත්, සිරිසේන විමලවීර

26 පිං පෙට්ටිය, රූකඩයෝ හා රජදැක්ම යන වීදි නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

(1) දීපානි සිල්වා (2) ජෙරම් ලක්ෂ්මන් ද සිල්වා

(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) විජිත ගුණරත්න

- පහත වගුව අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ක | ච | ට | ත |
|---|---|---|---|
| කන්නගි | පිරිත් පිංකම | කපු යන්තරය | මුව මල විදීම |
| පාලග | ආලවක දමනය | වඳ බිසව් | ගබඩාකොල්ලය |
| මී බන්ධන | මිලින්ද ප්‍රශ්නය | උණුනු පියන | අස්නය නැවීම |

27 ඉහත වගුවේ 'ක' අයත් වන්නේ,

(1) මඩු ශාන්තිකර්මය (2) රටයකුම (3) සූනියම් යාගය (4) වලියක් මංගල්‍යය

28 ඉහත වගුවේ 'ච' කාණ්ඩය අයත් වන්නේ,

(1) කොහොඹාකංකාරිය (2) බෞද්ධ පූජාකර්මය

(3) දෙවොල් මඩුවය (4) වඩිගපටුනය

29 ඉහත වගුවේ ''ට'' අයත් වන්නේ,

(1) සන්නියකුම (2) දෙවොල්මඩුවය (3) රිද්දි යාගය (4) කොහොඹාකංකාරිය

30 ඉහත වගුවේ 'ත' අයත් වන්නේ,

(1) සූනියම් යාගය (2) වල්ලියක් මංගල්‍යය

(3) දෙවොල් මඩුවය (4) කොහොඹාකංකාරිය

- පහත මුහුණු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




A B C D

31 ඉහත රූප සටහනේ AD හා BC යනුවෙන් දැක්වෙන්නේ,

(1) ABCD යනු සන්නි මුහුණු ය.

(2) ABCD යනු කෝලම් මුහුණු ය.

(3) ABCD යනු සන්නි හෝ කෝලම් මුහුණු නොවේ.

(4) AB යනු සන්නි මුහුණු ය. CD යනු කෝලම් මුහුණු ය.

32 ඉහත රූපසටහනේ A හා D යනු

(1) A යනු බිහිරි සන්නිය D යනු නාග සන්නිය

(2) A යනු නොංචි කෝලමයි C යනු ජස කෝලමය

(3) A යනු කණ සන්නිය D යනු පොලිස් කෝලමයි

(4) A යනු දේව සන්නිය D යනු පොලිස් කෝලමයි

33 නාට්‍ය නිර්මාණයක ඉදිරි පැවැත්ම රඳා පවතින්නේ,

(1) නිෂ්පාදකගේ කැපවීම මතය (2) ප්‍රේක්ෂක ප්‍රතිචාර මතය

(3) නළුනිළි රංගනය මතය (4) අනුශාංගික ශිල්ප දායකත්වය අනුවය

- පහත වගුවේ දැක්වෙන තොරතුරු අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තන/අනුවර්තන | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසි විලියම්ස් | A | හෙන්රි ජයසේන |
| ඉක්නෙවුටා ඉ | සොපොක්ලිස් | බෙරහඬ | B |
| C | හයුගොෆොක් | සකල ජන | බන්දුල ජයවර්ධන |
| ද ත්‍රීපෙනි ඔපෙරා | D | පැංස 3 කතාව | විජිත ගුණවර්ධන |

34 ඉහත වගුවේ 'A' සඳහන් අනුවර්තනය වන්නේ,

(1) පැංස කතාව (2) හරිම බඩු හයක් (3) බෙරහඬ (4) අහස් මාලිගා

35 වගුවෙහි 'B' සඳහන් විය යුතු මෙරට නිෂ්පාදකයා විය යුත්තේ,

(1) හෙන්රි ජයසේන (2) පියදාස නිශ්ශංක

(3) බන්දුල ජයවර්ධන (4) සුගතපාල ද සිල්වා

36 වගුවෙහි 'C' සඳහන් නාට්‍යය විය යුත්තේ,

(1) ග්ලාස් මෙනාජරි (2) එල්ඩර් සන් (3) එව්රි මෑන් (4) ඉක්නෙවුටා ඉ

37 වගුවෙහි 'D' සඳහන් නාට්‍ය රචකයා විය යුත්තේ,

(1) බ්‍රර්ටෝල් බ්‍රෙෂ්ට්

(2) සොපොක්ලිස්

(3) සැමුවෙල් බෙකට්

(4) මැක්සිම් ගෝර්කි

- පහත රූප සටහන් ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



ක



ච



ට



ත

38 මහගිරිදඹ, පුත්‍ර සමාගම, අන්දරේලා යන නාට්‍ය නිෂ්පාදනය කළේ,

(1) ක (2) ච (3) ට (4) ත

39 සුප්‍රකට වීදි නාට්‍ය ශිල්පියා වන්නේ;

(1) ච (2) ට (3) ක (4) ත

40 'ලෙඩක් නැති ලෙඩෙක්' නාට්‍යය හා කුවේණි නාට්‍යය නිෂ්පාදනය කළ නාට්‍යකරු වන්නේ පිළිවෙලින්,

(1) 'ක' හා 'ට' (2) 'ට' හා 'ත' (3) 'ච' හා 'ත' (4) 'ච' හා 'ට'

(ල. 40)

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## ஊவா மாகாண கல்வித் திணைக்களம்
## Uva Provincial Department of Education

2375

## අ.පො.ස. (සාමාන්‍ය පෙළ) - පෙරහුරු පරීක්ෂණය - 2019

| 11 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව - I පත්‍රය | කාලය පැය 01 යි |
|---|---|---|

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්න වල නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය (1), (2), (3), (4) තෝරන්න.
- ඔබ තෝරාගත් උත්තරයෙහි කවය තුළ (X) ලකුණ යොදන්න.

- පහත දැක්වෙන පද්‍ය පාඨ හා ගද්‍ය පාඨ ඇසුරෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - "කෑමට බීමට ඇඳුම පැළඳුමට - ගෙයට දොරට යාන වාහනයට තරහයක් නැති ලොවක් ළඟා කර දෙන්න"

B - "අම්බරයේ සඳ සේ දිලී රූ සිරු ඇගේ"

C - "මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ - අපේ උද්‍යානේ ක්‍රීඩා සැපා"

D - "නොමද සිතිවිලි සීත බියකරු - භූත වෙස් ගෙන මා පෙළයි නිති මාගෙ මව හා නැඟණියන් ගැන - සිතේ නිරතුරු ඇත ඊදී බිය"

E - "මොකක්ද ඔහේට තියෙන අයිතිය අපට මේ විදිහට නින්දා කරන්න. හරියට ඔහේ තඩුකාරකම වින්නඹු අම්මගෙන් අරගෙන ආව වගේ?"

01. විදුර නූර්තියට අයත් පද්‍ය කොටසකි.
1. A  2. B  3. C  4. D

02. දික්තල කාලගෝල නාට්‍යයට අයත් පද්‍ය කොටසකි.
1. A  2. B  3. C  4. D

03. සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණයකි.
1. A  2. B  3. C  4. D

04. සෝමලතා සුබසිංහ මහත්මියගේ "විකෘති" නාට්‍යයට අයත් කොටසකි.
1. A  2. B  3. C  4. D

05. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ නාට්‍යයක එන පරිවර්තන කොටසකි.
1. E  2. B  3. C  4. D

06. ප්‍රාසාංගික කලා අතර වැදගත් වන්නේ,
1. සංගීතය  2. නර්තනය  3. නාට්‍ය  4. සාහිත්‍ය

07. ගායනය ප්‍රමුඛ ජීවමාන කලාවකි.
1. බැලේ  2. ඔපෙරා  3. ගීත  4. මුද්‍රා

08. නළු ප්‍රේක්ෂක සම්බන්ධතාව ඉතා වැදගත්,
1. නාට්‍ය වලදී  2. බැලේ වලදී  3. සිනමාවේ දී  4. ප්‍රසංග වලදී

09. නාට්‍යක අන්තර්ගත කලාංග අතර
1. කථා වස්තුව ප්‍රබල වේ.
2. ගීත ප්‍රධාන වේ.
3. නළුවන් ප්‍රධාන වේ.
4. තේමාව ප්‍රධාන වේ.

10. ආහාර්ය අභිනයේ විශේෂ අංගයකි.
1. ශරීරය 2. රංගාලෝකය 3. නිරූපණය 4. චරිතය

11. ධාරා පහන් යනු
1. ඉලක්කයට විහිදී යන පහන් ය.
2. ගලා යන එළිය සහිත පහන් ය.
3. පරිසරය දක්වන පහන් ය.
4. රවුම් පහන් ය.

12. පාවෙන වළාකුළු, ගින්දර, වැස්ස යනාදිය මැවීමට භාවිතා කරන්නේ,
1. යොමු පහනයි
2. වර්ණ චක්‍රයයි
3. ධාරා පහනයි.
4. ප්‍රක්ෂේපන යන්ත්‍රයයි

13. නාඩගම් රඟ දැක්වීමට රාත්‍රී කාලයේ උපයෝගී කරගනු ලැබුවේ,
1. පන්දමයි 2. පොල්තෙල් පහනයි 3. විලක්කුවයි 4. කිට්සන් පහනයි

14. අභ්‍යන්තර සහ බාහිර සමාරෝපය යන දෙකටම බලපෑනු ලබයි.
1. නළුවා 2. නළු කාරිය 3. වේශ භූෂණයි 4. නිරූපණයයි

15. නාට්‍ය ශෛලීන්
1. එකකි. 2. දෙකකි. 3. තුනකි 4. හතරකි.

16. චරිතාංග අංග රචනයේ දී
1. විවිධ චරිත යොදා ගනී.
2. නිර්මාණ හා නිර්මාණශීලි චරිත යොදා ගනී
3. ප්‍රබල චරිත යොදා ගනී.
4. මුහුණ පමණක් යොදා ගනී.

17. ප්‍රධාන අංග රචනා ප්‍රභේද,
1. එකකි. 2. දෙකකි. 3. තුනකි 4. හතරකි.

18. සංගීතය යොදා නොගත් නාට්‍යයකි.
1. කැළණි පාලම 2. තට්ටු ගෙවල් 3. නරි බෑණා 4. එකගෙයි මිනිස්සු

19. රංග වින්‍යාසය යනු,
1. නාට්‍යයක කථා පුවතයි.
2. නාට්‍යයක යම් අවස්ථාවක් තාලාන්විතව හා රිද්මයානුකූලව පෙළ ගැස්වීමයි.
3. වේදිකාවේ සමබරතාව ආරක්ෂා කිරීමයි.
4. දර්ශන තලයන් වෙනස් කිරීමයි.

20. නාට්‍ය ඉදිරිපත් කිරීමේ දී විවිධ අවස්ථාවන්ට උචිත අයුරින් රංග භූමිය සකස් කිරීම.
1. සමාරෝපය යි.
2. වේශ නිරූපණය යි.
3. රංග වින්‍යාසය යි.
4. රංග භූමි අලංකරණය යි.

අංක 21 සිට 27 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමේ දී පහත සටහන උපයෝගී කර ගන්න.

| | මුල් කෘතිය | රචකයා | පරිවර්තිත නම | පරිවර්තකයා |
|---|---|---|---|---|
| 1 | A | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හුණුවටයේ කථාව | හෙන්රි ජයසේන |
| 2 | ද පබ්ලික් එනිමි | B | ජනහතුරා | සුනන්ද මහේන්ද්‍ර |
| 3 | දි එල්ඩර් සන් | ඇලෙක්සැන්ඩර් වැම්පිලෝව් | පුත්‍ර සමාගම | C |
| 4 | රත්නාවලී නාටිකා | ශ්‍රී හර්ෂ | D | පියදාස නිශ්ශංක |
| 5 | රූඩන්ස් | E | කඹය | බන්දුල ජයවර්ධන |
| 6 | F | ඔගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් | පීතෘ | ප්‍රේමරංජිත් තිලකරත්න |
| 7 | ඩෝල්ස් හවුස් | හෙන්රික් ඉබ්සන් | G | සුනිල් විජේසිරිවර්ධන |

21. "A" අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතිය වන්නේ,
    1. ගුඩ් වුමන්
    2. දෙර් කරේජ්
    3. ද කොකේසියන් චෝක් සර්කල්
    4. ද බ්‍රැගන්

22. "B" අක්ෂරයෙන් දැක්වෙන රචකයා
    1. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් 2. හෙන්රික් ඉබ්සන් 3. ස්ටැනිස්ලව්ස්කි 4. බර්නාඩ් ෂෝ

23. "C" අක්ෂරයෙන් දැක්වෙන නාට්‍ය රචකයා වන්නේ,
    1. ප්‍රසන්න විතානගේ 2. බන්දුල ජයවර්ධන 3. ජයලාල් රෝහණ 4. සුනන්ද මහේන්ද්‍ර

24. "D" අක්ෂරයෙන් දැක්වෙන පරිවර්තිත නම වන්නේ,
    1. රූකඩ ගෙදර 2. සෙල්ලම් ගෙදර 3. රත්නාවලී 4. සකුන්තලා


25. "E" අක්ෂරයෙන් දැක්වෙන රචකයා වන්නේ,
    1. ජ්ලෝටස් 2. ඉබ්සන් 3. බ්‍රෙෂ්ට් 4. සෙනෙකා

26. "F" අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතිය වන්නේ,
    1. ද බ්‍රැගන්
    2. අරයිවල්ස්
    3. ද ෆෙදර්
    4. පිස් ඇන්ඩ් ක්වයට්

27. "G" අක්ෂරයෙන් දැක්වෙන පරිවර්තිත නම වන්නේ,
    1. බෙරහඩ 2. මහ ගෙදර 3. මූදු පුත්තු 4. සබොනිකි ගෙදර

- අංක 28 සිට 33 දක්වා ප්‍රශ්න වලට පහත පින්තූර ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

ක ච ට ත ප



28. නාට්‍ය ධර්මී සහා ලෝක ධර්මී යන නාට්‍ය ශෛලීන් දෙකේම ඉතා දක්ෂ ලෙස චරිත නිරූපණය කළ ශිල්පියෙකි.
    1. ක 2. ච 3. ට 4. ත

29. ගුරු තරුව නාට්‍ය යේ ගුරුතුමියගේ චරිතයට පණ පෙවූ ශිල්පිණිය,
    1. ක 2. ච 3. ට 4. ත

30. වීදි නාට්‍ය කලාවේ කැපී පෙණුනු චරිතයකි.
1. ට  2. ක  3. ච  4. ත

31. "මධුර ජවනිකා" නාට්‍යයේ රඟ පෑ ප්‍රකට නළුවෙකි.
1. ට  2. ප  3. ක  4. ච

32. "කැළණි පාලම" නාට්‍යයේ රඟ පෑ දක්ෂ නිළියකි.
1. ප  2. ට  3. ක  4. ච

33. "ගරිල්ලා මාකට්ං" චිත්‍රපටයේ මොහු ප්‍රබල චරිතයක් නිරූපණය කළේ ය.
1. ක  2. ත  3. ට  4. ක

- **පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් අංක 34 සහ 35 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**


ක


ග

34. මෙහි දැක්වෙනුයේ
1. සොකරි මුහුණුය  2. සන්නි මුහුණුය  3. යාග මුහුණුය  4. කෝලම මුහුණුය

35. මෙම වෙස්මුහුණු
1. ආරච්චි, ජසයා  2. ආරච්චි, පොලිස්  3. බිහිරි, මුදලි  4. පිස්සු, ගුල්ම

36. "කණ" සම්බන්ධ අභ්‍යාසයකි.
1. සපා කන හඬ
2. සිනා හඬ
3. කාසිය බිම වැටෙන හඬ
4. දෙහි හැපීම

37. වර්තමාන වේදිකාව
1. රඟ මඩල
2. රඟ පීඨය
3. ප්‍රොසීනියම් වේදිකාව
4. රංග භූමිය

38. පිංතූර රාමු වේදිකාවේ කල්පිත බෙදීම
1. හතයි  2. නවයයි  3. අටයි  4. හයයි

39. රූකඩ නටවන ශිල්පියා හඳුන්වන විශේෂ නාමය වන්නේ,
1. සූත්‍රධාර යි.
2. නඩේ ගුරා යි.
3. මහ ගුරුන්නාන්සේ යි.
4. අන්තවිරාල යි.

40. "රංගාලෝකය" අර්ථකථනය කිරීම යන්නෙහි අදහස වන්නේ,
1. වේදිකා උපකරණ සැකසීම යනුයි.
2. විදුලි ආලෝකය භාව ප්‍රකාශනයට හා නළු ප්‍රේක්ෂක පහසුව පිණිස යොදා ගැනීමයි.
3. ප්‍රේක්ෂක රස වින්දනයට උදව් වීමයි.
4. නළු කාර්යට පහසු වීමයි.

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# අ.පො.ස. (සාමාන්‍ය පෙළ) - පෙරහුරු පරීක්ෂණය - 2019

| 11 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව - II පත්‍රය | කාලය පැය 02 යි |
|---|---|---|

2374

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. විකෘති නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   (i). විකෘති නාට්‍ය පෙළ රචනා කළේ කවුද? (ලකුණු 01)
   (ii). නාට්‍ය තුළින් පිළිබිඹු කරන ප්‍රියංගනී ගේ දක්ෂතා මොනවාද? (ලකුණු 02)
   (iii). සමස්ත නාට්‍යයේ මුඛ්‍ය තේමාව කුමක් ද? (ලකුණු 02)
   (iv). මෙහි අප්‍රධාන චරිත 04 ක් නම් කරන්න. (ලකුණු 02)
   (v). මෙම නාට්‍ය තුළින් මතු කෙරෙන ඛේදවාචකය කුමක් ද? (ලකුණු 02)
   (vi). සමස්ත නාට්‍යයේ මුඛ්‍ය තේමාව හෙළි කරන ගීතය ලියා දක්වන්න. (ලකුණු 02)

02. (i). වේෂ භූෂණ යනු මොනවාද? එය අයත් වන්නේ කුමන අභිනයට ද? (ලකුණු 02)
   (ii). වේදිකා නාට්‍යයක් සඳහා වේෂ භූෂණ නිර්මාණයේ දී වේෂ භූෂණ ශිල්පියෙකු සැලකිය යුතු කරුණු මොනවාද? (ලකුණු 04)
   (iii). ඔබ නැරඹූ ලෝක ධර්මී හෝ නාට්‍ය ධර්මී නාට්‍යයක භාවිතා කළ වේෂ භූෂණ නාට්‍යයේ සාර්ථකත්වයට ඉවහල් වූයේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 06)

03. (i). ශ්‍රී ලංකාවේ පැරණිම ජන නාටකය කුමක්ද? එය පැවැත්වීමේ පරමාර්ථ මොනවාද? (ලකුණු 02)
   (ii). එහි උපත් කතාව විස්තර කරන්න. (ලකුණු 04)
   (iii). එම ජන නාටකයේ රංග ශෛලිය උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

04. (i). මූලික අංග රචනා ප්‍රභේද නම් කරන්න. (ලකුණු 02)
   (ii). අංග රචනා අමු ද්‍රව්‍ය 04 ක් නම් කර ඒවා භාවිතා වන්නේ කෙසේදැයි දක්වන්න. (ලකුණු 04)
   (iii). නිවැරදි ව අංග රචනයක් සිදු කිරීමේ දී අංග රචනා ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණු විස්තර කරන්න. (ලකුණු 06)

05. (i). පහත රට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්ති කර්ම 04 ක් නම් කරන්න. (ලකුණු 02)
   (ii). ගර්භ සංරක්ෂණය මූලික කොටගත් පහත රට ශාන්ති කර්මය නම් කොට එහි උපත් කතාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)
   (iii). එම ශාන්ති කර්මයේ එන එක් අන්තර් රංග අවස්ථාවක (නාට්‍ය පෙළපාලියක) අඩංගු නාට්‍යමය ලක්ෂණ උදාහරණ ඇසුරින් දක්වන්න. (ලකුණු 06)

06. (i). "අභිරූපණය" යන්න හඳුන්වන්න. (ලකුණු 02)
   (ii). අභිරූපණ රංගනයක දී භාවිතා වන ශිල්ප ක්‍රම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)
   (iii). "අභිරූපණ රංගනය සාමාන්‍ය තාත්ත්වික රංගනයට වඩා වෙනස් වේ" අභිරූපණ රංගනයක සුවිශේෂී ලක්ෂණ ඇසුරින් විමසන්න. (ලකුණු 06)

07. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.
   - ආර්ථික දුෂ්කරතා මැද වුව ද සාමාන්‍ය පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත් වීමට අපේක්ෂාවෙන් ඉගෙනුම ලබන කසුන් ට විභාගයට පෙර දින රාත්‍රියේ ගැලූ ගං වතුරෙන් ඉතිරි වන්නේ ඇඳි වත පමණි........

   (i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)
   (ii) සංවාද හා රංග විධාන සහිතව පෙළ රචනා කිරීමට (ලකුණු 08)